---

## විසර්ජන ශීර්ෂය - 113 - වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය

## විගණකාධිපති වාර්තාව - 2010 වර්ෂය

### 1.1 විගණන විෂය පථය

වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනිකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 ජනවාරි 25 වන දින සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනිකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන වල තත්ත්වය ප්‍රකාශය වන, මෙහි (අ)

හා (ඇ) හි වූ පොදු නිරීක්ෂණ සහ1.4 සිට 1.6 දක්වා වූ ඡේද වල ඇතුලත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) <u>වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම</u>

වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

(ආ) <u>විසර්ජන ගිණුම</u>

(i) <u>මුළු ප්‍රතිපාදනය හා වියදම</u>

වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.30,580,255,000 වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.29,287,295,352 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.1,292,959,648 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.23 කි. විස්තර පහත දැක්වේ.

| වියදම් වර්ගය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය | මුළු ශුද්ධ ප්‍රතිපාදනය | මුළු වියදම | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 155,690,000 | 151,747,000 | 138,109,253 | 13,637,747 | 8.99 |
| මූලධන | 30,411,865,000 | 30,428,508,000 | 29,149,186,099 | 1,279,321,901 | 4.20 |
| එකතුව | 30,567,555,000 | 30,580,255,000 | 29,287,295,352 | 1,292,959,648 | 4.23 |

(ii) <u>අයවැය විචලනය</u>

ශීර්ෂ 113 යටතේ වැය විෂයන් 02ක් සඳහා සලසා තිබුණු රු.1,220,364,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

| <u>වැය විෂයය</u> | <u>ඉතිරිවීම්</u> |
|---|---|
| | රු. |
| 113-1-1-2401 | 100,000 |
| 113-2-3-2104-12 | 1,220,264,000 |
| | 1,220,364,000 |

===========

(ඇ) <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය</u>

(i) ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,674,147 ක් වූ අතර චලනය නොවන හිඟ ණය ශේෂ 12 කට අදාලව රු.1,228,339 ක හිඟ ණය ශේෂ හා අත්තිකාරම් පැවති අතර එම මුදල් අයකර ගැනීම පිළිබඳව පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුනි.

(ii) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 ඡේදය ප්‍රකාරව ස්ථාන මාරුවීම් ලැබ වසර 05 ක් ඉකුත් වූ නිලධාරීන් 06 දෙනෙකුට අදාල රු.462,583 ක හිඟ ණය ශේෂ 2010 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

1.4 <u>වත්කම් කලමනාකරනය</u>

i අමාත්‍යාංශය යටතේ ඇති සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය සමාගම් සතුව පවතින අතිරික්ත වාහන එකී ආයතනවල මෙහෙයුම් කටයුතුවලට බාධා නොවන පරිදි භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය සහිතව අමාත්‍ය කාර්‍ය මණ්ඩලයට ලබා දිය හැකි වුවද, සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය සංස්ථා විසින් කුලී පදනම මත ලබාගෙන තිබුණු වාහන 3 ක් අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා ලබා දී තිබූ අතර, එම වාහන 3 සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් රු.800,000 කට ආසන්න කුලියක් ගෙවා තිබුණි. මෙසේ කටයුතු කිරීම තුලින් අමාත්‍යාංශයේ තථ්‍ය වියදම් පෙන්වීමක් සිදු නොවන අතර, රාජ්‍ය වියදම අඩුවෙන් දැක්වීමක් සිදුවන බව නිරීක්ෂණය වේ.

ii එසේම අමාත්‍යාංශ ප්‍රයෝජනය සඳහා ලබාදී තිබූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාහන 07ක් නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම වෙනුවෙන් අධිකාරිය රු. 1,193,018 ක වියදමක් සමාලෝචිත වර්ෂය තුල වැය කර තිබුණි.

iii අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් මුදාහැර තිබූ එක් වාහනයක් ගිනි තබා විනාශ කර තිබුන ද අමාත්‍යාංශය ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

## 1.5 <u>මානව සම්පත් කළමනාකරණය</u>

### (අ) <u>අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු</u>

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 03 | - |
| (ii) | තෘතික මට්ටම | 08 | 08. | - |
| (iii) | ද්විතික මට්ටම | 29 | 28 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 18 | 18 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 01. | - |
| | එකතුව | 59 | 58 | 01 |